# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, තැ.පෙ. 1559, කොළඹ 0 1.
பொதுத்திறைசேரி, நிதி திட்டமிடல் அமைச்சு, த.பெ.இல.1559, கொழும்பு 01.
General Treasury, Ministry of Finance & Planning, P.O.Box: 1559, Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094 112 484729, dgto@tod.treasury.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax: 0094 112 484970
පොදු / பொது / General: 0094 112 484500, 0094 112 484600


මගේ අංකය / எனது இல / My No.: TO/REV/M2/07/2010
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2011.12. 30

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක:05/2011

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානින්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**2011.12.31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම.**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 01/2002 හා 2002.07.17 දිනැති චක්‍රලේඛය හා එයට කරන ලද සංශෝධන පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරීන් විසින් තම වගකීම යටතේ පවතින ආදායම් සංකේතාංකවලට අදාලව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව හය මසකට වරක් ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

| ආදායම් ශීර්ෂ සංකේතාංකය | විස්තරය |
|---|---|
| 20.02.01.01 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - රජයේ ගොඩනැගිලි කුලී |
| 20.02.01.99 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොලිය - වෙනත් |
| 20.03.01.00 | විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු - විවිධ |
| 20.03.03.00 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් |
| 20.05.99.00 | වර්තන පැවරීම් - වෙනත් |
| 20.06.02.00 | ප්‍රාග්ධන ආදායම් - ප්‍රාග්ධන වත්කම් විකිණීම |

03. එබැවින්, ඉහත දැක්වෙන ආදායම් සංකේතාංක සඳහා 2011.07.01 සිට 2011.12.31 න් අවසන් 06 මාසය සඳහා හිඟ ආදායම් වාර්තා ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක.01/2002 හි දක්වා ඇති ආකෘති පත්‍රය (ඇමුණුම 1) අනුව සකස්කර 2012.01.20 දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. අදාල දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් කරුණාකර හිස් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

එම්.එස්.ඩී රණසිරි
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව.

පිටපත් :- 1. විගණකාධිපති.
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව.

ඇමුණුම 01

# හිඟ ආදායම් පිළිබඳ වාර්තාව - 2011.12.31

(i) ව්‍යවස්ථාපිත අධිකාරිය :-

(ii) ආදායම් ඒකකය :-

(iii) ආදායම් අංකය :-

| විස්තරය (1) | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු (7) | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග (8) | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය (9) |
|---|---|---|---|---|---|---|---|---|
| | 2008.12.31 දින දක්වා හිඟ මුදල රු. (2) | 2009 වසරට අදාළ හිඟ මුදල රු. (3) | 2010 වසරට අදාල හිඟ මුදල රු. (4) | 2011 වසරට අදාල හිඟ මුදල රු.. (5) | 2011.12.31 දිනට මුළු හිඟ මුදල (2-5 එකතුව) රු. (6) | | | |
| | | | | | | | | |

දිනය :-

නිවැරදි බවට සහතික කරමි

..

ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා /දිස්ත්‍රික් ලේකම්